# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1801/35 - 2013 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2013.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

උප සභාපති, සභාපති ධූරයට පත්වීම හේතු කොට ගෙන ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

උප සභාපති වන අමිල් මීගස්දෙණිය කංකානම්ගේ නම් වූ උප සභාපති අයත්වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා චන්ද්‍රසිරි මුණසිංහ මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී මාතර ආච්චිගේ පද්මසිරි චන්ද්‍රවංශ පෙරේරා වන මම, චන්ද්‍රසිරි මුණසිංහ මහතා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. ඒ. පී. සී. පෙරේරා,
තේරීම්භාර නිලධාරී,
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 12 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

03 - 1147

1A - G 17432 — 350 (2013/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*